සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 09- ශ්‍රේණිය

## පෙරදිග සංගීතය

**නම/විභාග අංකය :- ..........................................................** **කාලය: පැය 02 යි.**

**I කොටස**

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) පහත දැක්වෙන රාග අතුරෙන් ශුද්ධ ස්වර සියල්ලම යෙදෙන රාගය කුමක් ද?
(1) යමන් (2) බිලාවල් (3) කාෆි (4) භෛරවී

(02) සංගීත විෂයය හදාරන ආධුනිකයකු ආරම්භයේදීම පුහුණු කළ යුතු සංගීතාංගයක් තෝරන්න.
(1) ස්වර අභ්‍යාස (2) මුඛ්‍යාංගය (3) තානාලංකාර (4) රාග අලාප

(03) තාලයකින් තොරව නිර්මාණ ය වී ඇති රාගයට ආවේණික ස්වර ඛණ්ඩය හඳුන්වනු ලබන්නේ,
(1) ස්ථායී නමිනි. (2) මුඛ්‍යාංගය නමිනි.
(3) මුකුඩා නමිනි. (4) තානාලංකාර නමිනි.

(04) ඖඩව, ෂාඩව සම්පූර්ණ යන රාගජාති ස්වර සංඛ්‍යා මගින් දැක්වෙන්නේ පිළිවෙළින්,
(1) 5 6 7 වශයෙනි. (2) 6 5 7 වශයෙනි.
(3) 7 6 5 වශයෙනි (4) 6 7 5 වශයෙනි.

(05) නිර්දේශිත රාග අතුරෙන් මධ්‍යමය හා නිශාදය ස්වර වර්ජිතව යෙදෙන රාගය නම් කරන්න.
(1) බිලාවල් (2) යමන් (3) කාෆි (4) භූපාලි

(06) ධ ගෙ න ති | න ක ධි න යෙදෙන තබ්ලා පදය වැයීමට සුදුසු ගී පාදය තෝරන්න.
(1) සුවඳ පද්ම (2) මිහිකත නලවාලා (3) සසර වසනතුරු (4) රන්මලක් ලෙස

(07) ගරි, ගප, ධ, නිසං යන මුඛ්‍යාංගය අයත් රාගය වනුයේ,
(1) කාෆි (2) භූපාලි
(3) බිලාවල් (4) භෛරවී

(08) ධා ධිං ධිං ධා | ධා ධිං ධිං ධා | ධා තිං තිං තා | ...... ...... ...... |
මෙම ඨේකාවේ සිව්වන විභාගයට ඇතුළත් වන අවනද්ධ අක්ෂර තෝරන්න.
(1) ධා ධිං ධිං ධා (2) ධා තිං තිං තා (3) තා ධිං ධිං ධා (4) ධා ධා ධිං තා

(09) මන්නාරම් පිටි වැල්ලේ........| මධුර යාමේ ..... යන ගී රාගාශ්‍රිතව නිර්මාණය කරගත් ගීත දෙකකි. ඒ සඳහා යොදා ගත් රාගය කුමක් ?

(1) භූපාලි (2) යමන් (3) කාෆි (4) බිලාවල්

(10) පෙරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය අනුව වයලීනය, බටනලාව, ජල තරංග, තබ්ලාව, යන සංගීත භාණ්ඩ හතර අයත් වන්නේ පිළිවෙලින්,

(1) තත්, අවනද්ධ, සුෂිර, ඝණ යන වර්ගවලට ය.

(2) ඝණ, අවනද්ධ, තත්, සුෂිර යන වර්ගවලට ය.

(3) තත්, සුෂිර, ඝණ, අවනද්ධ යන වර්ගවලට ය.

(4) අවනද්ධ, ඝණ, සුෂිර, තත් යන වර්ගවලට ය.

- අංක 11 සිට 14 තෙක් ඇති ප්‍රශ්න වලට පහත සඳහන් රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| A රූපය | B රූපය | C රූපය | D රූපය |
|---|---|---|---|
|  |  |  |  |

(11) ''ආලෙ බැන්ද මාගෙ රම්‍ය වන්'' යන ගීතය ගායනයේදී යොදා ගනු ලබන තාල වාද්‍ය භාණ්ඩය තෝරන්න.

(1) A (2) B (3) C (4) D

(12) B අක්ෂරයට හිමි භාණ්ඩයෙන් වාදනය කළ හැකි බෙරපදය කුමක්ද?

(1) දො ං ජි | ජි ග ත (2) ජි ම් | ත කු | ත ත් | දො ම්

(3) ගු ං ද | දෙ ග ත | ග ති ග | ත ගු ඳ (4) දො ං | ජි ං ත | ග ත | දො ං ත

(13) පංචතූර්ය වාදනයේ, හේවිසි පූජාව සඳහා යොදාගනු ලබන භාණ්ඩය කි.

(1) A (2) B (3) C (4) D

(14) D අක්ෂරය දක්වෙන භාණ්ඩය සහය වාදනයට යොදා ගනිමින් ගායනය කළ හැකි ගී පාදය තෝරන්න.

(1) ගම් වල සැම තැන ඇවිද ගොසින්නේ (2) මෝරා ...... බීජ යෙනා........

(3) ගම්භීර කාලිංග නුවර.... (4) මං වගෙ පේඩි කතක් මනා.

(15) ගිටාරයේ ස්වර පිහිටීම දක්වෙන නිවැරදි පිළිතුර සඳහන් කරන්න.

(1) E A D G B E (2) D G B C E G (3) A B C D E F G (4) E F G A B C

(16) රබාන, ගිටාරය, එකෝඩියන්, කොංගෝ, බොංගෝ වැනි සංගීත භාණ්ඩ සුවිශේෂීව යොදා ගනිමින් ගායනා කළ ගීත විශේෂය වන්නේ,

(1) ඛ්‍යාල් ගීත (2) ලක්ෂණ ගීත (3) සර්ගම් (4) කැලිප්සෝ


(17) පෙරදිග සංගීතයේ ථාය නොහාත් මේල දහය හඳුන්වා දුන් පණ්ඩිතුමා කවුරුන් ද?

(1) ජයදේව පණ්ඩිතුමා
(2) අමීර්කුෂ්රු පණ්ඩිතුමා
(3) විෂ්ණු නාරායන් භාත්ඛන්ඩේ පණ්ඩිතුමා
(4) රත්නජංකර් පණ්ඩිතුමා

(18) රාග විස්තර ඇතුළත් වනසේ පද මාලාව නිර්මාණය වී ඇති ගීත මෙනමින් හඳුන්ව යි.

(1) ඛ්‍යාල් ගීත
(2) ලක්ෂණ ගීත
(3) සර්ගම්
(4) ගසල්

(19)




ඉහතින් දක්වා ඇත්තේ ගිටාරයක ස්වර පිහිටීම ලකුණු කරන ලද රූප සටහනකි. මෙහි ලකුණු කර ඇති තිත් රූප අනුව, පෙන්වා දී ඇති Chord (කෝඩ්) එක වනුයේ,

(1) C Major Chord
(2) F Major Chord
(3) G Major Chord
(4) D Major Chord

(20) ''මයික්‍රොෆෝනය'' යනු ශබ්දය,

(1) ග්‍රහණය කරගන්නා උපකරණයකි.
(2) බාහිර පරිසරයට මුදා හරින උපකරණයකි
(3) විචිත්‍රවත් කරන උපකරණයකි.
(4) අඩු වැඩි කරන උපකරණයකි.

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (1) ස්වර සප්තකය තුළ යෙදෙන අචල ස්වර දෙක නම් කරන්න. (ලකුණු 01)

(2) නූර්ති ගීත ගායනයේදී සහය වන තාල වාද්‍ය භාණ්ඩය කුමක් ද? (ලකුණු 01)

(3) x x | x x - | x x | x x - | මෙම රිද්ම රටාවට ගැලපෙන හින්දුස්ථානි තාලය සහ දේශීය තිත නම් කරන්න. (ලකුණු 02)

(4) ''තාරාවෝ ඉගිලෙති'' මෙම පද දෙකෙහි ඇති ලඝු අක්ෂර හා ගුරු අක්ෂර ගණන ලියන්න. (ලකුණු 02)

(5) ''බැත, අම්බරුවන්, මුදුන'' ආදී පද (වචන) ඇතුළත් කෘෂිකර්මාන්තය හා සම්බන්ධ ගීත විශේෂය නම් කරන්න. (ලකුණු 01)

(6) බැලෝව මගින් නාදය (හඬ) උපදවන ස්වර පුවරු භාණ්ඩ 2 ක් නම් කරන්න. (ලකුණු 02)

(7) C Major Scale අයත් ස්වර ලියන්න. (ලකුණු 01)

(8) ''ධ ගෙ න ති න ක ධි ත'' යන අවනද්ධ අක්ෂර වලින් ගොඩනැගෙන නිර්දේශිත තාල දෙක නම් කරන්න. (ලකුණු 02)

(02) නිර්දේශිත රාග අතර ඇති රාග දෙකකට අයත් ස්වර සංගති පහත දැක්වේ.

A- ස ස රි රි ග ග ම ම ප

B- ග රි ස ධ , ස රි ග , ස් ධ ප ග ප ධ ස්

(1) ඉහත සඳහන් ස්වර ඛණ්ඩ අයත් වන රාග දෙක නම් කරන්න. (ලකුණු 04)

(2) එම රාග දෙකෙන් ඔබ කැමති එක් රාගයකට අයත් මධ්‍යලය ගීතයක අන්තරා කොටස ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ලකුණු 04)

(3) එම ගීතයට ගැලපෙන හින්දුස්ථානී තාලය නම් කර ප්‍රස්ථාර කරන්න. (ලකුණු 04)

(03) පහත දැක්වෙනුයේ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය වූ නූර්ති හා නවනාට්‍ය ගීත කිහිපයක් මුල් පාදයන්ය.

(i) වාසනා දිනේකි මේක පාමු තුටින් සිතේ.....

(ii) සෝබාව දේ මෙපුර.......

(iii) හෙළ ගැඹුරුයි - පුත නොබලන් ..........

(iv) දැක්කොත් පත්මාවතී.........

(v) ඇත කඳුකර හිමව් අරණේ ..........

(vi) ලියමු මේ සිංහල භාෂාවෙන් ........

(vii) කුමටද සොබනියෙ කඳුළු සලන්නේ ..........

(viii) අහෝ දුක වාවන්ට බෑ දූන් මගේ දෙවියනේ .........

(1) මෙම ගී පාදයන් ''නූර්ති'' හා ''නවනාට්‍ය'' යන දෙකොටසට වෙන් කර ලියන්න. (ලකුණු 04)

(2) ඉන් ඔබ කැමති ගීතයක් ලියන්න. (ලකුණු 04)

(3) ඉහත ගී පාද අතරින් ඔබ කැමති නූර්තියක් හා නවනාට්‍යයක් නම් කර එහි නිෂ්පාදකවරු දෙදෙනා නම් කරන්න. (ලකුණු 04)

(04) පහත දැක්වෙන්නේ නිර්දේශිත රාගයකට අයත් ස්වර ඛණ්ඩයකි.

''ස රි ග ම ප ම ග ම රි ස''

(1) ඉහත ස්වර ඛණ්ඩය අයත් රාගය නම් කරන්න. (ලකුණු 03)

(2) එම රාගයේ ආරෝහණ, වාදී, සංවාදි, ගාන සමය ලියා දක්වන්න. (ලකුණු 04)

(3) එම ස්වර ඛණ්ඩය භාවිතා කරමින් සුදුසු තාලයකට ස්වර පේලි දෙකක් නිර්මාණය කරන්න. (ලකුණු 05)

(05)

| A | B | C |
|---|---|---|
| මෝරා..... බීජයෙනා.... | නොමදින් විකුම් පාලා... | ලක්ෂ්මී.... බුජ වාසා... |

(1) ඉහත අක්ෂර වලින් දක්වා ඇති ගී පාද අයත් ගීත වර්ගය නම් කරන්න. (ලකුණු 03)

(2) පහත සඳහන් කරුණු එම අක්ෂරවලට නම් කර ඇති ගී පාද අයත් ගී වර්ගය අනුව වෙන්කර ලියන්න.

i) බෙරපදය, තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව ලෙස අංග හයකින් යුක්ත ය.

ii) ප්‍රභූන්ගේ ගුණ වර්ණනාත්මක ස්වරූපයෙන් ගායනා කරන ගීත විශේෂයකි.

iii) උඩරට සම්ප්‍රදායට අයත් මෙම කවි ගායනා, තානමකින් ආරම්භ කරයි.


iv) රජවාසලේ මෙම ගීත ගැයූ කණ්ඩායම හඳුන්වා ඇත්තේ වන්දිබට්ටයන් ලෙසය.

v) රජතුමා විසින් කරන ලද පරිශ්‍රමයන්, ජයග්‍රහණයන් වර්ණනා කරමින් ලියන ලද ගීත විශේෂයකි.

(ලකුණු 05)

(3) මෙම ගීත අතරින් ඔබ කැමති ගීතයක පද හතරක් ලියන්න. (ලකුණු 04)


(06)



(1) ඉහත දැක්වෙන බටහිර ප්‍රස්ථාරය පෙරදිග ක්‍රමයට හරවා ලියන්න. (ලකුණු 04)

(2) එම පෙරදිගට හැරවූ ප්‍රස්ථාරය මධ්‍යම භාවයෙන් ලියන්න. (ලකුණු 04)

(3) මෙම සංකේත නම් කරන්න.



(ලකුණු 02)

(4) මෙම ස්වර වටිනාකම්වලට අදාළ නාමයන් (අපරදිග) සඳහන් කරන්න.

(a) 𝅝 - (මාත්‍රා 4 )

(b) 𝅗𝅥 - (මාත්‍රා 2)

(c) ♩ - (මාත්‍රා 1)

(d) ♪ - (මාත්‍රා ½)

(07) පහත සඳහන් මාතෘකා අතරින් 'තුනක්' තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය (ලක්ෂණ, ගායක කණ්ඩායම්, ප්‍රචලිත ගීත, ගායක ගායිකාවන්)

(2) අපරදිග භාණ්ඩ වර්ගීකරණය (උදාහරණ සහිතව)

(3) ''ජන ගී ආශ්‍රිතව නිර්මාණය වූ සරල ගීත'' (පදනම් කරගත් ජන කවි, ගීතයට පාදක වූ රිද්මය, ගීත ගැයූ ගායක ගායිකාවන්)

(4) සංගීත ප්‍රසංගයක දී භාවිතාවන තාක්ෂණික මෙවලම්

(5) ස්වරපුවරු සංගීත භාණ්ඩ (ලකුණු 12)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 09 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 1 | (06) | 2 | (11) | 3 | (16) | 4 |
| (02) | 1 | (07) | 3 | (12) | 3 | (17) | 3 |
| (03) | 2 | (08) | 3 | (13) | 1 | (18) | 2 |
| (04) | 1 | (09) | 1 | (14) | 2 | (19) | 1 |
| (05) | 4 | (10) | 3 | (15) | 1 | (20) | 2 |

(ලකුණු 40)

**II පත්‍රය**

**(01)** **(1)** ස,ප

(2) තබ්ලාව

(3) ජප්තාලය හා සුළු මැඳුම් දෙතිත

(4) ලඝු අක්ෂර - 04

ගුරු අක්ෂර - 03

(5) කමත් ගී

(6) සර්පිනාව , එකෝඩියන්

(7) C D E F G A B

(8) ලාවනී තාලය, කෙහෙර්වා තාලය (ලකුණු 12)

(02) (1) A - කාෆි රාගය

B - භූපාලි රාගය (ලකුණු 04)

(2) මධ්‍ය ලය ගීතයට අදාලව අන්තරා කොටස නිවැරදිව ගීත ස්වර ප්‍රස්ථාර කිරීම. (ලකුණු 04)

(3) එම මධ්‍ය ලය ගීතයට ගැලපෙන හින්දුස්ථානී තාලය නම් කොට ප්‍රස්ථාර කිරීම. (ලකුණු 04)

(03) (1) නූර්ති නව නාට්‍ය ලෙස වෙන් කිරීම (ලකුණු 04)

(2) ගීතය ලිවීම (ලකුණු 04)

(3) නූර්තිය හා නිෂ්පාදකයා නම් කිරීම

නවනාට්‍ය හා නිෂ්පාදනය නම් කිරීම (ලකුණු 04)

(04) (1) බිලාවල් රාගය (ලකුණු 03)

(2) ස රි ග ම ප ධ නි ස ධ , ග උදය කාලය/දිවා ප්‍රථම ප්‍රහරය (ලකුණු 04)

(3) සුදුසු ස්වර පේළි දෙකක් නිර්මාණය කිරීම. (ලකුණු 05)

(05) (1) A - වන්නම්

B - හටන් ගී

C - ප්‍රශස්ති (ලකුණු 03)

(2) i) වන්නම්

ii) ප්‍රශස්ති

iii) වන්නම්

iv) ප්‍රශස්ති

v) හටන් ගී (ලකුණු 05)

(3) ලියන ලද ගී පද හතරට (ලකුණු 04)

(06) (1) ස රි ග ම / ප - - රි / නි නි ධ ධ / ප - - - / (ලකුණු 04)

(2) ම ප ධ නි / ස - - ප / ග ග රි රි / ස - - - / (ලකුණු 04)

(3) නිවැරදිව සංකේත නම් කිරීම (ලකුණු 02)

(4) (a) සෙමිබ්‍රිව් ( Semebreve)

(b) මිනිම් ( minim)

(c) ක්‍රොචට් ( Crochet)

(d) ක්වේවර් ( Quaver) (ලකුණු 02)

(07) මාතෘකා තුනකට අදාලව කෙටි සටහන් ලිවීම. (ලකුණු 12)